**දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග-II)- 2020**

-------------------------------------------------------------------------------------

දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග-II) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළැඹි අංක 3579 එස්ආර්අයි සහ අංක 3580 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුම් සහ 2019 නොවැම්බර් 13 දින එළැඹි අංක 3851 එස්ආර්අයි යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය**

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 165,185 කට සමාන එ.ජ.ඩො. මිලියන 1,084.60 ක් වන අතර ඉන් රු. මිලියන 137,070 කට සමාන එ.ජ.ඩො. මිලියන 900 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 28,115 කට සමාන එ.ජ.ඩො. මිලියන 184.6 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහනේ මූල්‍ය සැලසුම බහු අදියර මූල්‍ය පහසුකම යටතේ අදියර පහකින් සමන්විත අතර 2020 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 300 ක් වූ පළමු අදියර දෙකෙහි ගිවිසුම් ණය ප්‍රදානකරු සමඟ අත්සන් කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කරන ලද අතර 2027 මාර්තු 31 දින වන විට නිමකිරීමට නියමිතය.

**1.3 මතය**

මාගේ මතය අනුව, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2020 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් නිරූපනය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------------------------- | ------------- | ---------------------- | ------------------------- |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 5 හි 36 ඡේදයට පටහැනිව, විදේශ මෙහෙයුම් වලින් හටගන්නා විනිමය වෙනස්කම් ව්‍යාපෘතියේ ශුද්ධ වත්කම් යටතේ හඳුනාගෙන නොතිබුණි. | මිලියන 75.8 | ලබන වර්ෂයේ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එය නිවැරදි කිරීමට සටහන් කර ඇත. | විදේශ මෙහෙයුම් වලින් හටගන්නා විනිමය වෙනස්කම් ව්‍යාපෘතියේ ශුද්ධ වත්කම් යටතේ හඳුනා ගත යුතුය. |

## 2.2 නොසැසඳූ ශේෂ

| මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අදාළ වාර්තා වලට අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| රු.මිලියන 27,865.9 | මහා භාණ්ඩාගාරයට අනුව රු. මිලියන 32,895.6 කි. | මිලියන 5,029.7 | 2021 සිට සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කෙරේ. | අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර වෙනස්කම් අවම කළ යුතුය. |
| | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අනුව රු. මිලියන 28,762.7 | මිලියන 896.8 | | |

## 2.3 රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| අංකය | රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකයක අවම වටිනාකම පිළිගත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ අවශ්‍ය සීමාවට වඩා අඩු අතුරු ගෙවීම් සහතික ඇගයීමේ අවස්ථා 259 ක් පැකේජ 50 ක් යටතේ නිරීක්ෂණය විය. | කොවිඩ් -19, අයහපත් කාලගුණය, අමුද්‍රව්‍ය හිඟය වැනි හේතු නිසා කොන්ත්‍රාත්කරුවන්ට අමතර පිරිවැයක් දැරීමට සිදු විය හැකිය. අපි මූලික කොන්දේසි පිළිපදින්නේ නම් කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ප්‍රවාහයට බලපෑම් ඇති වන අතර ඔවුන්ට අඩු ප්‍රගතියක් පවා ලබා ගැනීමට නොහැකි වනු ඇත. | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන අනවශ්‍ය වාසි අවම කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල දක්වා ඇති සීමාවන්ට අනුගතවීම අවශ්‍ය වේ. |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි වල 4.2 උප වගන්තිය | කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරක්ෂණ ඔවුන්ගේ | සාමාන්‍ය කොන්දේසිය සංශෝධනය කරන ලද අතර නැගෙනහිර, උතුරු | ලංසු ලියකියවිලි නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික |

| | | | | |
|---|---|---|---|---|
| | | වියදමින් ලබා දිය යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විට කාර්ය සාධන සුරක්ෂණවල පිරිවැය ආපසු ගෙවීම සඳහා ඌව පළාතේ කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 85.64 ක මුදලක් ගෙවා තිබුණි. | සහ බස්නාහිර පළාත් පැකේජවල ප්‍රමාණ පත්‍රවලින් එම ගෙවීම් අයිතමය ඉවත් කරන ලදී. | ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. |
| (ඈ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 119.1 (1), (2) සහ (3) උප වගන්ති | 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් විසින් බීටී 02 සහ බීටී 03 පැකේජ වල වැඩ, උපකරණ, තෙවන පාර්ශවයන් සහ දේපල, කම්කරුවන්ගේ වන්දි සහ වෘත්තීය වන්දි රක්‍ෂණය කර නොතිබුණි. | කොන්ත්‍රාත්වල සාමාන්‍ය සහ විශේෂිත කොන්දේසිවල දක්වා ඇති විශේෂිත පිරිවිතරයන්ට අදාළ සියළුම රක්‍ෂණ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර තිබුණි. | කොන්ත්‍රාත් පිරිවිතරයන්හි දක්වා ඇති පරිදි කොන්ත්‍රාත්කරුවන්ගෙන් අවශ්‍ය රක්‍ෂණ ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2017 මාර්තු 15 දිනැති ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.3 වගන්තිය සඳහා වූ 31 වන අතිරේකය | ජාතික සහ ජාත්‍යන්තර මිල කැඳවීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවන් සඳහා උපරිම කාලසීමාව සති 15 ක් වුවද, උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වල සිවිල් වැඩ ප්‍රසම්පාදනයන් සඳහා වූ සම්මත කාල සීමාව සති 25 සිට සති 38 දක්වා වූ කාලයකින් ඉක්මවා ගොස් තිබුණි. | ප්‍රසම්පාදන කාලසටහනට අනුව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන කමිටු නැවත පත් කිරීම, ලංසු තැබීමේ අවසන් දිනය දීර්ඝ කිරීම, මිල ගණන් සාකච්ඡා කිරීම වැනි පාලනයෙන් තොර හේතු නිසා සමහර ක්‍රියාකාරකම් ප්‍රමාද විය. | ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල සීමාව තුළ අවසන් කළ යුතුය. |
| (ඉ) | 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත | ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඕනෑම ඉදිකිරීම් කටයුත්තක නියැලීමට පෙර සෑම විදේශීය කොන්ත්‍රාත්කරුවෙකුම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් තාවකාලික | ආ.ස.බැ. මාර්ගෝපදේශයන්ට අනුව ලංසු තැබීම සඳහා ඉ.ක.ස.අ. යේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවය අනිවාර්ය නොවේ. එබැවින්, ලංසු තැබීමේදී එය නොසලකන ලදී. ලංසුකරුවන් ඔවුන් විසින් ඉ.ක.ස.අ. හි | කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට පෙර කොන්ත්‍රාත්කරුවන් ප්‍රමිතිකරණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලියාපදිංචියක් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකුට අදාළ කොන්ත්‍රාත් ලබා දීමට පෙර වැඩසටහන විසින් සීඅයිඩීඒ ලියාපදිංචිවීමේ අවශ්‍යතාවය සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ලියාපදිංචි වීම පිළිබඳව සටහන් කරගතිමි. | |
| (ඊ) | 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත. | රු. මිලියන 5 ට වැඩි වටිනාකමක් ඇති පොදු කොන්ත්‍රාත් වල ලංසුකරුවන් ලංසු තැබීමේ ලියකියවිලි ලබාගැනීමට පෙර පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු කොන්ත්‍රාත් ලියාපදිංචිය ලබා ගත යුතුය. අදාළ ලංසුකරුවන්ගේ තාක්ෂණික ලංසු ඇගයීමේදී එම අවශ්‍යතාව ව්‍යාපෘතිය විසින් සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය. | 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවය සලකා බලන ලදී. කෙසේ වෙතත්, මෙය ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව නුසුදුසු වීමේ නිර්ණායකයක් ලෙස සැලකිය නොහැක. | ලංසුකරුවන් සහ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්, පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

| අංකය | සංරචක | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ------- | --------- | --------------------- | ------------------------- | --------------- |
| (අ) | ජාතික හා ග්‍රාමීය මාර්ගවල මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රදානය කිරීම | මූලික සැලැස්ම අනුව, ව්‍යාපෘතිය විසින් පැකේජ 53 ක් යටතේ උතුර, නැගෙනහිර, ඌව සහ බස්නාහිර පළාත්වල ජාතික මාර්ග 27 ක කි.මී. 340 ක සහ ග්‍රාමීය මාර්ග 1405 ක කි.මී. 3400 ක මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වූවත්, 2020 දෙසැම්බර් 31 දිනට ජාතික මාර්ග | වෙනත් ව්‍යාපෘති යටතේ එම මාර්ග වැඩිදියුණු කර තිබූ හෙයින් මූලිකව තෝරාගත් සමහර මාර්ග අතහැර දැමීමට සිදු විය. බස්නාහිර පළාතේ ජාතික මාර්ග | ව්‍යාපෘතියේ මූලික සැලැස්මට අනුකූලව සහ කාල සීමාව තුළදී ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 27 ක කි.මී. 319.96 ක සහ ග්‍රාමීය මාර්ග 1349 ක කි.මී. 3313.16 ක ප්‍රතිසංස්කරණ කටයුතු පමණක් ප්‍රදානය කර තිබුණි. | කි.මී 73 ක් හැර සෙසු සියලු ඉතිරි මාර්ග නියමිත දිනට ප්‍රදානය කර ඇත. | |
| (ආ) | ජාතික හා ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම. | සමස්ථ දිග කි.මී. 25.05 කින් සමන්විත ග්‍රාමීය මාර්ග 13 ක් පමණක් නිම කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. තවද, පුනරුත්ථාපන කටයුතු සිදු කෙරෙමින් පවතින ඉතිරි මාර්ග අතරින්, 2020 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග කි.මී 39.97 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී 731.62 ක් පමණක් නිම කර තිබුණි. මේ අනුව, එය පිරිනමන ලද ජාතික හා ග්‍රාමීය මාර්ග දිගින් සියයට 21.93 ක් පමණක් නියෝජනය විය. | ඉදිකිරීම් හා කාර්ය සාධනය පදනම් කරගත් නඩත්තු කටයුතු අවසන් වූ පසු පාරවල් භාර දෙනු ලැබේ. තවද, අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස වෙන් නොකිරීම හේතුවෙන් උතුරු පළාතේ කොන්ත්‍රාත් ලබාදීම වසරකට වඩා ප්‍රමාද කිරීමට සිදු විය. ණය කාලය අවසන් වීමට පෙර සියලු මාර්ග නිම කළ හැකි බව අපට නිශ්චිතව පැවසිය හැකිය. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. |

**3.2 වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා අවසන් කිරීම ප්‍රමාද වීම**

| | විස්තරය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | --------- | ---------------------- | ------------------------- | ------------- |
| (අ) | මාර්ග පුනරුත්ථාපන සිවිල් වැඩ ආරම්භ කිරීම. | කොන්ත්‍රාත් පැකේජ ප්‍රදානය කළ වහාම කොන්ත්‍රාත්කරුවන් විසින් සිවිල් වැඩ ආරම්භ කළ යුතු වුවත්, කොන්ත්‍රාත් පැකේජ 37 ක සිවිල් වැඩ ආරම්භ කිරීමට දින 30 සිට දින 203 දක්වා වූ කාලයක් ප්‍රමාද වී තිබුණි. එසේ ප්‍රමාද වීමට හේතු විගණනයේදී අනාවරණය නොවුණි. | ආරම්භක දිනය නියම කරන තුරු, කොන්ත්‍රාත්කරුට මිනුම් කටයුතු, විමර්ශන සහ සැලසුම් කටයුතු පවා ආරම්භ කළ නොහැක. | කොන්ත්‍රාත් පිරිනැමූ වහාම සිවිල් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | උපකරණ ප්‍රසම්පාදනය | ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්ම සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. 2,230,000 ක | වැඩසටහනේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය උපකරණවල වැදගත්කම සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට තීරණය | වැඩසටහනේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය උපකරණ නියමිත වේලාවට මිලදී |

| | | | |
|---|---|---|---|
| | උපකරණ ප්‍රසම්පාදන 06 ක ලංසු දැන්වීම් පළකිරීමට සැලසුම් කර තිබුණද, එම මිලදී ගැනීම් කිසිවක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | කෙරිණි. ඒ අනුව උපකරණ අවශ්‍යතාවය තීරණය කර අවසන් කළ අතර ප්‍රසම්පාදන කටයුතු 2021 දෙවන කාර්තුවේදී ආරම්භ කෙරෙණු ඇත. | ගත යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍ර නිසි ලෙස ඇගයීම සිදුකළ යුතු වුවත්, ඉහත මාර්ගෝපදේශ වලට පටහැනි අවස්ථා පහත දැක්වේ. | | |
| | (i) ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍රවල වැරදි අර්ථකථනයන් සිදුකිරීම සහ අනුපාත විෂමතා හේතුවෙන්, බීජ් 4 සහ බීජ් 5 කොන්ත්‍රාත් පැකේජ වලට අදාළව 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියට රු. මිලියන 48.2 ක පාඩුවක් දැරීමට සිදුව තිබුණි. | බීජ් 4 සහ බීජ් 5 කොන්ත්‍රාත් වල ඇගයීම් කළ මිල ගණන් සාධාරණ වනු ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ ඇගයීම් මාර්ගෝපදේශ උපදෙස්වලට අනුව අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසු ඇගයීම සිදුකර ඇත. | පාඩුව අය කර ගැනීම සඳහා වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. |
| | (ii) ඒඑම් 01, ඒඑම් 02 සහ ඒඑම් 03 පැකේජ වලට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව සහ ප්‍රමාණ පත්‍ර අතර මූලික අයිතම් කිහිපයක රේටයන්ගේ විෂමතාවයන් කිහිපයක් නිරීක්ෂණය විය. එම පැකේජ 03 ට අදාළව එකතු වටිනාකම රු. මිලියන 1,035 ක් වූ සියයට 50 ඉක්මවූ විචලනයන් නිරීක්ෂණය විය. | මහාමාර්ග අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද මහාමාර්ග රේටයන් (HSR) පදනම් කරගෙන ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කරණු ලැබේ. මෙම මිල ගණන් ජාතික මහාමාර්ග වල ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගැනේ. එම නිසා, ඉංජිනේරු ඇස්තමේන්තුවේ සහ ලංසු මිල ගණන් වල වෙනස්කම් වළක්වා ගත නොහැකිවනු ඇත. | ඉංජිනේරු ඇස්තමේන්තු යථාර්ථවාදී ලෙස සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව වැඩසටහන අවසානයේ සියළුම රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනුම් උපකරණ කොන්ත්‍රාත්කරු වෙතම ආපසු ලබා දෙනු ලැබුවද, රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනුම් උපකරණ සඳහා එකවර සිදුකරණු ලබන ගෙවීමක් ලෙස පිළිවෙලින් රු. මිලියන 593 ක් සහ රු. මිලියන 16.23 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි. මේ අනුව, අසාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනිසි ප්‍රතිලාභ ලබා දීමට හේතු විය හැකි බව එයින් හැඟීයනු ඇත. | ආපසු ලබාදෙනු ලබන වත්කම් වල අවශේෂ වටිනාකම් ලංසු අගය අඩු කිරීමට හේතු වනු ඇත. තවද, මෙම අයිතමයන් වසර 2-3 කට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුව අවසානයේදී බොහෝ විට භාවිතා කළ නොහැකි හෝ යල් පැන ගිය තත්ත්වයේ පවතී. | සාමාන්‍යයෙන්, අදාළ වත්කම් සේවායෝජකයා විසින් රඳවා ගනු ඇත. එබැවින්, ආධාර යටතේ අරමුදල් සපයන අනෙකුත් ව්‍යාපෘති මඟින් පිරිනමන කොන්ත්‍රාත් පැකේජ වල පිරිවැය හා සැසඳීමේදී මෙම වැඩ සටහන යටතේ ඇති කොන්ත්‍රාත්වල පිරිවැය අඩු අගයක් ගතයුතු වනු ඇත. |
| (ඇ) | නැගෙනහිර පළාතේ 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග පුනරුත්පාදන ප්‍රගති වාර්තාවට ඇතුළත් කර ඇති මාර්ග 6 ක් පහසුකම් පරිපාලන අත්පොතට හෝ තෝරාගත් කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කළ අදාළ කොන්ත්‍රාත් පැකේජ යටතේ ඇතුළත් කර නොතිබුණි. එබැවින් අලුතින් එකතු කරන ලද මාර්ග සඳහා ව්‍යාපෘතිය මඟින් ආ.ස.බැ. සහ ජාතික සැළසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන තිබේද යන්න විගණනයට තහවුරු නොවුණි. තවද, එම කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදය සහ විෂය පථය වෙනස් කිරීම සඳහා ණය දෙන ආයතනයේ අනුමැතිය ඉදිරිපත් කර නොතිබුණි. | ආ.ස.බැ. අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | විෂය පථය වෙනස් කළ යුත්තේ ණය දෙන ආයතනයේ සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවයෙන් පසුව පමණි. |

**3.4 වැඩබිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------- | -------------------- | -------------------------------- | ------------ |
| (අ) | ඉ.ක.ස.අ. (ICTAD) විසින් නිකුත් කරන ලද මාර්ග සහ පාලම් ඉදිකිරීම හා නඩත්තු කිරීම | කේඑල් 04 හි නිවැරදි කිරීමේ කටයුතු 2021 මාර්තු 09 දින වන විට | ඉ.ක.ස.අ. (ICTAD) විසින් නිකුත් කරන |

| | | | |
|---|---|---|---|
| | සඳහා වූ සම්මත පිරිවිතර (එස්සීඒ/5) හි 506.5 (එච්) උප වගන්තියට අනුව, අදාල ස්ථානයෙන් ගනුලබන සම්පීඩිත මතුපිට තාර ස්ථරයේ සියලු සාම්පල වල ඝණත්වය මාෂල් ඝණත්වයෙන් සියයට 97 ට නොඅඩු විය යුතුය. කෙසේ වෙතත්, කේඑල් 04 සහ කේඑල් 06 කොන්ත්‍රාත් පැකේජ යටතේ පිළිවෙලින් වලාන - බෙක්කේගම - හොරණ පාරේ (227) සහ බෝතලාව පාරේ (113 ඒ) මතුපිට තාර ස්ථරය ඉහත ප්‍රමිතියට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය. | සිදු කර නොතිබුණු බැවින් ඉංජිනේරුවරයා විසින් ගෙවීමක් නිර්දේශ කර නොමැත. කෙසේ වෙතත්, කේඑල් 113 ඒ හි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග 2021 මාර්තු 01 දින සතුටුදායක ලෙස අවසන් කර තිබුණි. | ලද මාර්ග සහ පාලම් ඉදිකිරීම හා නඩත්තු කිරීම සඳහා වූ සම්මත පිරිවිතර (එස්සීඒ/5 වලට දැඩි ලෙස අනුකූල විය යුතු අතර කොන්ත්‍රාත්කරු විසින් නිවැරදි කිරීම් සිදු කරන තුරු ගෙවීම් නොකළ යුතුය. |
| (ආ) | KL 06 පැකේජය යටතේ කි.මී. 4.78 ක දිගකින් යුත් බෝතලාව ග්‍රාමීය මාර්ගය (අතිරේක) (මාර්ග අංක 113 ඒ) එම ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වලට ඇතුළත් කර නොතිබුණු අතර තවද, විගණනය සඳහා ලබා දුන් 2020 දෙසැම්බර් මාසය සඳහා වූ ව්‍යාපෘති ප්‍රගති වාර්තාවේ එය දක්වා නොතිබුණි. මේ අනුව මෙම මාර්ගය පුණරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්කරු තෝරා ගත් ක්‍රමවේදය සහ ආ.ස.බැ. සහ භාණ්ඩාගාරයේ එකඟතාවය විගණනය සඳහා ඉදිරිපත් නෙකෙරුණි. | එය සේවායෝජකයා විසින් අනුමත කර ඇති අතර 2021 ජනවාරි මස ප්‍රගති වාර්තාවේ වෙනම පෙන්වා ඇත. | ව්‍යාපෘති විෂය පථය වෙනස් කළ යුත්තේ ණය දෙන ආයතනයේ සහ භාණ්ඩාගාරයේ එකඟතාවයෙන් පසුව පමණි. |
| (ඇ) | KL 06 යටතේ මාර්ග අංක 113 ඒ- බෝතලාව පාරේ (අතිරේක) මතුපිට තාර ස්ථරය ඇතිරීමට පෙර මාර්ගය දෙපස අත්‍යාවශ්‍ය ස්ථානවල පවා කාණු ඉදිකර නොතිබුණි. එම නිසා අනාගතයේදී යන්ත්‍රෝපකරණ භාවිතයෙන් කාණු සඳහා පස් කැණීමේදී තාර ස්ථරයට හානි වීමට එය හේතු විය හැකිය. ව්‍යාපෘතිය විසින් මාර්ගයේ 0+990 ස්ථානයේ බෝක්කුවක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණද, හියුම් පයිප්පය ඇතුරු ප්‍රදේශය අවට කොන්ක්‍රීට් දැමීමෙන් තොරව තනි හියුම් පයිප්පයක් පමණක් අතුරා තිබුණි. තවද බෝක්කුවේ මතුපිට සහ බෝක්කුවේ දෙපස කොන්ක්‍රීට් කිරීමට ඉඩ නොතබා දැනටමත් තාර අතුරා ඇති බව නිරීක්ෂණය විය. | මෙම මාර්ගයට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇති අතර එම නිසා කානු හා බෝක්කු නිම කිරීමට පෙර තාර අතුරා අවසන් කෙරුණි. කොන්ත්‍රාත්කරු විසින් හිඟහිටි වැඩ කටයුතු සිදුකරමින් පවතී. | ඉදිකිරීම් කටයුතු සම්මත පිරිවිතරයන්ට දැඩි ලෙස අනුකූල විය යුතුය. |

**3.5 පරිබාහිර ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් මත ණය දෙන ආයතනයට රු. මිලියන 243.48 ක කැපකරු ගාස්තු අනාර්ථික ලෙස ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත කැපකරු ගාස්තුව රු. මිලියන 449.51 ක් විය. | එය ආර්ථික නොවන ගෙවීමක් වුවද කැපකරු ගාස්තු ගෙවීම නොවැළැක්විය හැකිය. නමුත් අරමුදල් භාවිත ඉලක්ක සපුරා ගැනීමෙන් එය අවම කළ හැකිය. | අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.6 මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ ගැටළු**

| සේවක තනතුර | තනතුරු සංඛ්‍යාව | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | අනුමත | 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | |
| ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | 6 | 1 | 5 | ව්‍යාපෘති කාර්ය සාධනය කෙරෙහි වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර ඇත. තවද, මා.ස.අ. න් (RDA) පිටත කාර්ය මණ්ඩලය පත් කිරීම සඳහා ඇති සීමාවන් මෙම පත්වීම් ලබා දීම සැලකිය යුතු ලෙස ප්‍රමාද කිරීමට හේතු වී තිබේ. | වැඩසටහනේ කාර්ය සාධනය උපරිම කිරීම සඳහා වැඩසටහන විසින් ප්‍රසස්ථ සේවක සංඛ්‍යාවක් නඩත්තු කළ යුතුය. |
| සම්බන්ධීකරණ ඉංජිනේරු | 14 | 4 | 10 | | |
| ව්‍යාපෘති ඉංජිනේරු | 28 | 20 | 8 | | |
| ව්‍යාපෘති ගණකාධිකාරී | 4 | 2 | 2 | | |

**3.7 ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට අදාළ ගැටළු**

| අංකය | ප්‍රධාන සේවක තනතුර | ව්‍යා.අ.ඒ. හි සේවා කාලය | වෙනත් ආයතන වල රැකියාවක සේවා නියුක්තියෙක්ද | සේවයේ නියුතු පදනම කොන්ත්‍රාත් පදනම මත/වැඩ බැලීමේ පදනම මත | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඌව) | මාස 01 | ඔව් (මාර්ග සංවර්ධන අධිකාරිය) | වැඩ බැලීමේ පදනම | මෙය තාවකාලික පියවරක් ලෙස වැඩ බැලීමේ පදනම මත පත් කරන ලද අතර ව්‍යාපෘති අධ්‍යක්‍ෂකවරයෙකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂ සෑම විටම පූර්ණ කාලීනව බඳවා ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ගණකාධිකාරී | වසර 02 ට වැඩි | අයි-මාර්ග I වැඩසටහනේ ගණකාධිකාරී | වැඩ බැලීමේ පදනම | අයි-මාර්ග I හි ගණකාධිකාරීවරයාගේ සේවය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා මෙම පත්වීම වැඩ බලන පදනමින් සිදු කර ඇත. | බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට අනුකූල විය යුතුය. |

**3.8 පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති පහසුකම් පරිපාලන අත්පොත සහ 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 වන වගන්තියට අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු පාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම පළාතකම පළාත් සම්බන්ධීකරණ කමිටු සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුමය වශයෙන් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, කමිටු රැස්වීම් දෙකම ප්‍රශස්ත ගණපූරණය යටතේ ඒ අනුව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොරෝනා වසංගතය හේතුවෙන් මෑත කාලයේ රැස්වීම් පවත්වා නොතිබුණි. | සියලුම මෙහෙයුම් කමිටු නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |